www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඇමරිකානු නිදහස් දිනයේ අර්ථභාරය ගැන ජේම්ස් පී. කැනන්ගෙන්

# කාල් මාක්ස්ගේ පටන් ජුලි හතර වන දා තෙක්

***James P. Cannon on the significance of Independence Day***

**From Karl Marx to the Fourth of July**

**ජේම්ස් පී. කැනන් විසිනි**

**2004 ජුලි 3**

*1951 ජුලි 16 දින ද මිලිටන්ට් පත්‍රයේ පල වූ ජේම්ස් පී. කැනන්ගේ ලිපියක් අපගේ පාඨකයන් වෙනුවෙන් අපි මෙහි පල කරමු. කැනන් (1890-1974) එක්සත් ජනපදයේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයෙක් ද ඇමරිකානු ට්‍රොට්ස්කිවාදයේ දිගු කාලීන නායකයෙක් ද විය.*

මම ආරම්භයේ පටන් ම ජුලි හතර වන දා මිනිසෙක්මි, ඒ සමග බැඳුනු ගිනි කෙලි සංදර්ශන, විනෝද චාරිකා සහ බෑන්ඩ් වාදන යනාදියට අතිශයින් ම ප්‍රිය කරන්නෙක්මි. අපේ රටේ ශ්‍රේෂ්ඨත්වයත් ඒ සියල්ල ඇරඹුනේ කවදා කෙසේ ද යන වගත් පිලිබඳ කීර්තිමත් කතාවට සවන් දීමට මා ඕනෑ ම වේලාවක සූදානම් ය. අප වෙසෙන මහාද්වීපය අප කිසිවකුත් දන්නවාට වඩා දිගු කලක් තිස්සේ පැවතී ඇත. එහෙත් ජාතියක් ලෙස, අන් සියල්ලටත් වඩා දෛවය විසින් වාසි සහගත තත්වයක් අත්පත් කර දෙනු ලැබ ඇති ස්වාධීන ජනතාවක් ලෙස අප පැවතෙන්නේ ස්වාධීනතා ප්‍රකාශනයේ හා ජුලි හතර වන දා සිට ය.

වසර 175කට ඉහත දී රැස් වූ කොංග්‍රස් මන්ඩලයෙහි නියෝජිතයෝ ශ්‍රේෂ්ඨ මූලාරම්භකයෝ වූහ. “අපි මෙම සත්‍යයන් ස්වයං-ස්ථාපිත සත්‍යයන් ලෙස සලකමු,” යැයි පැවසූ විට ඔවුන් දියත් කලේ සමස්ත මානව වර්ගයා ම වෙනුවෙන් බලාපොරොත්තුවේ නව යුගයක් විවෘත කල ව්‍යාපෘතියකි. වාදක කන්ඩායම් වාදනය අරඹන ඕනෑ ම අවස්ථාවක සැමරීමට මා සූදානම් වන්නේ එය යි — ආරම්භය හා ප්‍රතිඥාව යි. එහෙත් ආරම්භය අවසානය ලෙසත් ප්‍රතිඥාවක් දීම එය ඉෂ්ට කිරීම ලෙසත් ඉදිරිපත් කරමින් ජුලි හතර වන දා කතා මට පිලිගැන්වීමට කිසිවකුත් සමත් නො වනු ඇත. මා එවන් දේවල් ගැන විශ්වාස කිරීම අත හැරියේ බොහෝ කලකට පෙර ය. මේ රටේ සිදු වෙමින් පැවති දේවල් — තව මත් පවත්නා අසමානතාව හා අයුක්තිය — ගැන අවබෝධ කර ගැනීමට තරම් මා වැඩුනු වහා ම අපගේ ප්‍රථම විප්ලවයේ උරුමයට හිමිකම් කියන වරප්‍රසාදිතයන් වංචනිකයන් බව මට පසක් විය. සම්මත ජුලි හතර වන දා කථිකයන් බොරුකාරයන් ලෙස ද උතුම් සිහිනයක් කෙලෙසූවන් ලෙස ද මම හඳුනා ගතිමි. ඔවුහු 76 වසරේ නිදහසේ වීරයන් මෙන් නො වූහ.

එහෙත් ඒ හේතු කොට ගෙන අතීතයේ බොහෝ ඇමරිකානු රැඩිකලුන් හා විප්ලවවාදීන් මෙන් මම ජුලි හතර වන දාට එරෙහිව ගියේ නැත. ජුලි හතර වන දා අයත් වන්නේ ජනතාවට යැයි මම සිතුවෙමි. මා නිරතුරුව ම සැලකුවේ ජුලි හතර වන දා නිෂ්ක්‍රමනය ඇමරිකානු රැඩිකල්වාදය කල ලොකු ම වැරැද්දක් ලෙස ය. ජාත්‍යන්තරවාදය ඇමරිකානු විරෝධය සමග පටලවා ගැනීම වරදකි, අප රටේ විප්ලවවාදී සම්ප්‍රදායන් ප්‍රතිගාමීන්ගේ ඔඩොක්කුවට අත හැරීම වරදකි. 1776 වීරයන්ගේ යුක්ති යුක්ත උරුමකරුවන් වන නවීන විප්ලවවාදී කම්කරු ව්‍යාපාරය අප රටට ආගන්තුක දෙයක් ලෙස පෙනී යාමට ඉඩ දීම වරදකි.

ස්වකීය ජාතික ස්වාධීනත්වය වෙනුවෙන් සටන් වදින ආසියාවේ ජනතාවට අපගේ ම 1776 විප්ලවයේ නාමයෙන් සුභ පතමින් නිකුත් කෙරුනු ප්‍රකාශයක් මුල් පිටුවේ ම පල කරමින්, එමෙන් ම මෙම විප්ලවයටත් එහි අව්‍යාජ නායකයන්ටත් කැප කෙරුනු විශේෂ ලිපිවලින් යුත් සමස්ත පිටුවක් ද සහිත විශේෂ ජුලි හතර කලාපයකින් මේ වසරේ ද *මිලිටන්ට්* පත්‍රය විකසිත වනු දැකීමට මා බෙහෙවින් සතුටු වූයේ ඒ නිසා ය. මෙම විශේෂ කලාපයේ ලිපි පැහැදිලිව ම බැරෑරුම් අධ්‍යයනයක හා ඓතිහාසික පර්යේෂනයක ප්‍රතිඵල ය. වත්මන් ටෝරීන්ගේ සුවිශේෂ අවශ්‍යතාවන්ට සේවය කරනු පිනිස දිගු කලක් තිස්සේ වසං කෙරී තිබූ සහ හිතාමතා ම සඟවනු ලැබ පවා තිබූ විප්ලවයේ වැදගත් ම අංග ලක්ෂන මත එම ලිපි නව එලියක් විහිදුවයි. ඇමරිකානු කම්කරුවන්ගේ එලඹෙන විප්ලවය මීට වසර 175කට පෙර ජාතික ස්වාධීනත්වය සඳහා ගෙන ගිය විප්ලවයේ නිෂේධනය නො ව එය ඉදිරියට ගෙන යාම සහ පරිපූර්නත්වයට පත් කිරීම ලෙස දකින අයගේ අත්වලට බලගතු ප්‍රචාරක අවියක් මෙම එලිදරව් කිරීම් මගින් ලැබෙනු ඇත.

මෙම විශිෂ්ට ලිපිවල කතුවරුන් සිය පර්යේෂනවල දී මෙහෙයවනු ලැබුවේ සාරභූත සාධක සොයා ගනිමින් ඒවායේ අන්තර්-සම්බන්ධතා අධ්‍යයනය කිරීමක් ඉල්ලා සිටි න්‍යායක් මගිනි. ඔවුහු පන්ති අරගලයේ ගාමක බලවේගය — සමස්ත ඉතිහාසය ම පිලිබඳ සැබෑ

අවබෝධයක් ලබා ගැනීමේ යතුර — එලිමහනට ගෙන ඒමට යත්න දැරූහ. ප්‍රථම ඇමරිකානු විප්ලවය අධ්‍යයනය කිරීමට මෙම ලිපිවල කතුවරුන් උනන්දු කලා වූ ද ඔවුන්ගේ එම වැඩ කටයුතුවල දී ඔවුන්ට මග පෙන්වූ ද න්‍යාය වනාහි මාක්ස්වාදය යි — එනම්, කොංග්‍රස් මන්ඩලය හා උසාවි මගින් “විදේශ” මතවාදයක් ලෙස නීති විරෝධී කෙරෙනු ඇති සහ පාසල්වල ඉගැන්වීම දැන් මුලුමනින් ම පාහේ තහනම් කෙරී ඇති න්‍යාය යි.

*ද මිලිටන්ට්* ජුලි හතර කලාපයේ පල වී ඇති මෙම ලිපි අවසානයේ හැඩ ගැස්වූ ක්‍රියා දාමය ම සිත් කා වදින කතාවකි. ඒවා අප පක්ෂයේ මාක්ස්වාදී පාසලේ සිසුන්ගේ වැඩ කටයුතු ය. අපගේ පක්ෂ කේඩරවලට ඓතිහාසික කර්තව්‍යයක් ඉටු කිරීමට ඇත යන ප්‍රස්තුතයට අපි කැප වී සිටිමු. එම කර්තව්‍යය නම් ඇමරිකානු කම්කරු පන්තියේ එලඹෙන විප්ලවය සංවිධානය කොට එයට නායකත්වය දීම යි. එවන් දැවන්ත ප්‍රයත්නයක ශක්‍ය කාර්ය භාරයක් ඉටු කිරීමට සූදානම් වන අයකුට ඒ සඳහා මෙම ජාතිය බිහි වීමට තුඩු දුන් විප්ලවය අධ්‍යයනය කිරීමට වඩා හොඳ වෙනත් ක්‍රමයක් තිබිය හැක්කේ කෙසේ ද? තව ද ඉතිහාසය පිලිබඳව පවත්නා එක ම විප්ලවවාදී න්‍යායේ ආධාරයෙන් තොරව විප්ලවවාදී ඉතිහාසය බැරෑරුම්ව හා ඵලදායී ලෙස අධ්‍යයනය කල හැක්කේ කෙසේ ද? කොහොමටත් එය යි අපගේ දෘෂ්ටි ආස්ථානය. අපේ තරුන පරපුරේ නායකයන් කන්ඩායමක් සෑම වසරක් පාසා ම මාස හයක කාලයකට දිනපතා ක්‍රියාකාරකම්වලින් වෙන් කොට ගෙන තම රටේ ඉතිහාසයත් එය පැහැදිලි කිරීමට සමත් එක ම න්‍යාය වන මෙම “විදේශීය” මතවාදයත් අධ්‍යයනය කරනු පිනිස යෙදවීමට තරම් අපි ඒ සම්බන්ධව බැරෑරුම්ව සිටිමු.

මීට වඩා හොඳින් එකිනෙක හා ගැලපෙන විෂයයන් දෙකක් කිසි දාක සොයා ගත නො හැකි ය. ඇමරිකානු ධනවාදයේ වර්ධනයට පෙර තියා ම එය අද පවත්නා ආකාරයෙහි මූලික අංග ලක්ෂන පිලිබඳ සමස්ත පුලුල් චිත්‍රනයක් මාක්ස් ඉදිරිපත් කලේ ය. එහි ප්‍රතිලාභයක් ලෙස, ඇමරිකානු ධනවාදය එහි සියලු ප්‍රධාන අංග ලක්ෂන අනුව මාක්ස්වාදයේ උච්චතම සනාථනය බවට පත්ව ඇත. අපගේ ශිෂ්‍යයෝ ඇමරිකාව පිලිබඳව අධ්‍යයනය කරනු පිනිස මාක්ස් වෙත හැරෙන අතර ම මාක්ස් සනාථ කරනු පිනිස ඇමරිකාව ගැන අධ්‍යයනය කරති.

මාක්ස්වාදය වසර සියයක් පැරනි වන අතර වෘත්තීමය පන්ඩිතයන් විසින් එය දහස් වාරයක් ප්‍රතික්ෂේප කෙරී ඇත. එයිනුත් සෑහීමකට පත් නො වී එම කාරනාව සම්බන්ධයෙන් විද්‍යාත්මක අවශ්‍යතාවක් ඉක්මවා යන උත්සුකතාවක් සහිත මාක්ස්වාදයේ විරුද්ධවාදීහු තමන්ගේ සියලු ප්‍රකාශන ද සෙසු වැරදි තොරතුරු සපයන හා වැරදි අධ්‍යාපනය ලබා දෙන මාධ්‍ය ද හරහා දිනපතා, සතිපතා සහ මාස්පතා එය දිගට ම ප්‍රතික්ෂේප කිරීමේ යෙදී සිටිති. අපගේ ශිෂ්‍යයෝ මේ සියල්ල ම ගැන දන්නා අතර තම මතවාදය ගැන සිය අධ්‍යයනයේ ම කොටසක් ලෙස එම සියලු ප්‍රතික්ෂේප කිරීම් දැනුවත්ව පරීක්ෂාවට ලක් කරති. මෙම පරීක්ෂාවේ හා ප්‍රති-පරීක්ෂාවේ ක්‍රියා දාමය තුල දී ඔවුහු සැබෑ මාක්ස්වාදීහු බවට පත් වෙති. ඔවුහු ඔවුන්ගේ මතවාදය හොඳින් ඉගෙන ගන්නා අතර එසේ ඉගෙන ගැනීමේ දී එය භාවිතාවෙහි යෙදීම පිනිස ඉදිරියට යති. මාක්ස්වාදය යනු එහි ම ප්‍රයෝජනය උදෙසා අධ්‍යයනය කල යුතු ආධානග්‍රාහයක් නො ව සමාජ පරිනාමය පිලිබඳ න්‍යායක් හා පන්ති අරගලයේ දී ක්‍රියාවට මග පෙන්වීමක් ය. එය අතීත හා වර්තමාන සංයුක්ත යථාර්ථය පිලිබඳ ඥානයට ආදේශකයක් නො ව එය විමර්ශනය කිරීම හා අර්ථ නිරූපනය කිරීම සඳහා වන න්‍යායික අවියකි. අපගේ ශිෂ්‍යයෝ එය ඒ ආකාරයට අවබෝධ කර ගනිති. ඔවුහු මාක්ස් කරා ගියහ — ඇමරිකාව සොයා ගත්හ.

මගේ මතයට අනුව, එය ඉතා වැදගත් සොයා ගැනීමකි. අපට යුදකාමී ජාතිකවාදය හෝ මොන යම් හෝ වර්ගයක ග්‍රාම්‍ය ජාතික අහංකාරයක් හා උද්ධච්චකමක් සමග කිසිදු සම්බන්ධතාවක් නැත. අපි ජාත්‍යන්තරවාදියෝ වෙමු, අපගේ ඉරනම සෙසු ලෝකයේ ඉරනම සමග බැඳී ඇති බව අපි ඉතා හොඳින් දනිමු. සමාජය පරිවර්තනය කොට සමාජවාදී පර්යායක් ගෙන එන විප්ලවය ලෝක පරිමාන කටයුත්තකි, එය ජාත්‍යන්තර සහයෝගිතාව ඉල්ලා සිටින කර්තව්‍යයක් වන අතර අප ප්‍රතිපදානය කරන්නේ එහි කොටසක් පමනි. එහෙත් මෙම ජාත්‍යන්තර සහයෝගිතාවේ අපගේ කොටස වන්නේ මේ රට තුල විප්ලවය යි. අපි එයට යෙදී ගත යුත්තෙමු, එය අධ්‍යයනය කොට ඒ ගැන දැනුවත් විය යුත්තෙමු. අප අපගේ රට, එහි ඉතිහාසය හා සම්ප්‍රදායන් නො දන්නේ නම් අපට එය මනා ලෙස ඉටු කල නො හැකි වනු ඇත. ඒවා බොහෝ අංශයන්ගෙන් ගත් කල යහපත් ය. රට හැටියට ගත් කල එය යහපත් ය, එහි මහජනතාවගෙන් අතිමහත් බහුතරයක් ද යහපත් ය. ඔවුන්ගේ ජයග්‍රහනයන් බොහෝ ය, ඒවා ශ්‍රේෂ්ඨ ය. වැරදි මිනිසුන් එහි පාලනය ඩැහැ ගෙන එය අගාධය කරා ගෙන යන බව හැරුනු කොට ඇමරිකා එක්සත් ජනපදයේ කිසිදු වැරැද්දක් නැත.

එයට විසඳුම වන්නේ රට හා එහි සම්ප්‍රදායන් වීසි කර දැමීම නො ව බලය ඩැහැ ගෙන සිටින අය, විප්ලවය යන නම යටතේ අපගේ මුතුන්මිත්තන් විසින් ජනප්‍රියත්වයට පත් කරන ලද ක්‍රියා දාමය මගින් පලවා හැරීම යි. මෙම නව විප්ලවයට 1776 මිනිසුන් ආරම්භ කල කටයුත්ත සම්පූර්න කිරීමට සිදු වනු ඇත. ඔවුහු ජාතියේ ස්වාධීනත්වය සහතික කර ගත්හ. සිවිල් යුද්ධය නමින් ප්‍රසිද්ධ හැට ගනන්වල දෙවන ඇමරිකානු විප්ලවය වහල් දේපොල ක්‍රමය කුඩු කර දමා රට එක්සත් කොට එහි නිර්බාධිත කාර්මික වර්ධනය සඳහා මාවත විවෘත කලේ ය. තෙවන ඇමරිකානු විප්ලවයේ

කර්තව්‍යය වන්නේ මෙම දැවන්ත කාර්මික යන්ත්‍රය තමන්ගේ ම යහපත උදෙසා ක්‍රියාත්මක කරන පරපුටු කල්ලිය අතින් උදුරා ගෙන සියල්ලන්ගේ ම යහපත උදෙසා එය ක්‍රියාත්මක කිරීම යි.

එය යි පොදු අදහස. එහෙත් එය පෙනී යන තරම් බෙහෙවින් සරල නැත. ව්‍යාකූලතා සහ සංකීර්න ගැටලු පවතී. කම්කරුවෝ උගුල් හා රැවටීම් ජාලාවක් තුලින් සිය මග සොයා ගත යුත්තාහ. ඔවුන්ට සිතියමක් හා මාලිමාවක් අවශ්‍ය ය. අතීතයේ අත්දැකීම් සාමාන්‍යකරනය කර ගැනීමක් ද අනාගතය සඳහා න්‍යායිකව මග පෙන්වන පිලිවෙතක් ද ඔවුන්ට අවශ්‍ය ය. එය යි මාක්ස්වාදය. ඇමරිකානු කම්කරුවෝ මාක්ස් කරා පැමිනෙනු ඇත්තාහ, එමගින් ඔවුහු අපරාජිත වනු ඇත්තාහ. “වැඩි දියුනු ඇමරිකානු කම්කරුවන්ගේ උපදේශකයා බවට මාක්ස් පත් වනු ඇතැ” යි ට්‍රොට්ස්කි පැවසී ය. අප දරන්නේ ද එම මතය ම ය, අපි එය සාක්ෂාත් කරනු පිනිස වැඩ කරමු.

එංගලන්තයේ ජීවත් වෙමින් සිය ප්‍රගාඪ න්‍යාය එහි දී කෙටුම්පත් කල කාල් මාක්ස් නම් වූ ජර්මානු යුදෙව්වා සියලු රටවලට පොදු වැසියෙකි. ධනවාදය පිලිබඳ ශ්‍රේෂ්ඨතම විශ්ලේෂකයාට ධනවාදයේ වර්ධනය එහි උච්චතම අවස්ථාව කරා ලඟා වී ඇති එක්සත් ජනපදය අන් හැම තැනකට මත් වඩා හුරු පුරුදු නිවස්නකි. ඇමරිකානු කම්කරුවන්ට තමන්ගේ රට ගැන දැන ගැනීමට සහ එය වෙනස් කිරීමටත් එය සැබවින් ම තමන්ගේ රට බවට පත් කර ගැනීමටත් මාක්ස් උදව් කරනු ඇත.

© www.wsws.org